# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2422/39 - 2025 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 6/2017

### 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත

2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වන වගන්තියේ (ජ) සහ (ඣ) වන ඡේද සහ 9 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 39 වන වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල්
ගුවන් සේවා අමාත්‍ය.

2025 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 අංක 02 දරන සිවිල් ගුවන් සේවා (ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම් ලබා දීම වෙනුවෙන් ගාස්තු පැනවීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉහත කී පනතේ 9 වන වගන්තිය යටතේ සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත පවරා දෙනු ලැබ ඇති මෙහි උපලේඛනයේ (II) වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව එම උපලේඛනයේ (I) වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති සේවා සැපයුම්කරු වෙත ලබා දීම වෙනුවෙන් එම සේවා සැපයුම්කරු විසින් එම උපලේඛනයේ (III) වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මේ නියෝගවල කාර්ය සඳහා -

"අධිකාරිය" යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ;

"ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම්" යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම් අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ; සහ

"සේවා සැපයුම්කරු" යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3) වන වගන්තිය යටතේ පත් කරනු ලබන ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු අදහස් වේ.

## උපලේඛනය

| *(I) වන තීරුව* | *(II) වන තීරුව* | *(III) වන තීරුව* |
|---|---|---|
| *සේවා සැපයුම්කරු* | *ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම්* | *ගාස්තුව* |
| සී/ස ගුවන්තොටුපළ හා ගුවන් සේවා පුද්ගලික සමාගම | 1. රත්මලාන කදවල පාරේ පිහිටි සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.<br>2. රත්මලාන අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණාගාරය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.<br>3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා ගම්පහ, මඩම්පැල්ලේ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.<br>4. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ධාවන පථය සඳහා ගම්පහ, පමුණුගම කැපුන්ගොඩ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම. | සෑම වර්ෂ පහකට වරක් ම සියයට දහයකින් (10%) වැඩි වන ලෙස සංශෝධනය විය යුතු වන එක් එක් ගගන නාවික පහසුකම සහ ඊට ආබද්ධ ඉඩමක එක් හෙක්ටයාරයකට රුපියල් පනස් දහස (50,000.00) බැගින් වූ වාර්ෂික ගාස්තුවක් |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *(I) වන තීරුව* | *(II) වන තීරුව* | *(III) වන තීරුව* |
|---|---|---|
| *සේවා සැපයුම්කරු* | *ගගන නාවික පහසුකම් සහ ඊට ආබද්ධ ඉඩම්* | *ගාස්තුව* |
| | 5. පිදුරුතලාගල කන්දේ පිහිටුවා ඇති රේඩාර් ස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.<br><br>6. ගුවන් සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදිකර තිබෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල පිහිටි ඉඩම, එහි ඇති හෝ ඊට ආබද්ධ කවර හෝ ඉදිකිරීම් ද ඇතුළුව. | |

EOG 02 - 0056

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.